පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 290

ආයතනයේ නම: ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

රාජ්‍ය ආයතන, පළාත් සභා සහ පළාත් පාලන ආයතනවල මූල්‍ය අනුකූලතාවය සහ මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳ මාර්ගගත තොරතුරු කළමනාකරණය පද්ධතිය මඟින් ඇගයීම - 2021 මුදල් වර්ෂය

ආකෘති අංක 01

පාර්ලිමේන්තු මාලාවේ අංකය: 290
ආයතනයේ නම: ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

අනු අංකය	අඩු පාඩු හා දුර්වලතා	ගනු ලැබූ ක්‍රියාමාර්ග හා වර්තමාන ප්‍රගතිය
01	<u>පළමු කොටස : 90</u> අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුල පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් ඇතුලත පිළිතුරු ඉදිරිපත් කරන මෙන් සියළුම අංශ ප්‍රධානීන් දැනුවත් කර ඇති අතර මේ පිළිබඳව ත්‍රෛමාසිකව පවත්වන විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වලදී ද සාකච්ඡා කර පසු විපරම් කිරීම සිදු කරයි.
02	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මු.රෙ.ප්‍රකාරව මසක් තුල නිරවුල් කර නොතිබුණි.	2023.12.31 දින වන විට අදාල ගැලපුම් මු.රෙ.ප්‍රකාරව නිරවුල් කර ඇති අතර ඉදිරියේදී මසක් ඇතුලත අදාල නිරවුල් කිරීම සිදු කිරීම් පිළිබඳව අවධානයෙන් කටයුතු කරන ලෙස නිලධාරීන් දැනුවත් කර ඇත.
03.	වර්ෂයකට වඩා කාලයක සිට පැවත එන හිඟ ණය ශේෂ පැවතීම.	වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පවතින හිඟ ණය ශේෂ රු.157,934.50ක් පැවති අතර මේ වන විටඇපකරුවන්ගෙන් අයකර ගන්නා අතර 2023.12.31 වන විට රු.88.003.46ක ශේෂයක් පවති.
04.	පොදු තැන්පතු ගිණුමේ කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	2022.12.31 දින වන විට පැවති වසර 02ක ඉක්මවූ තැන්පතු වටිනාකම වන රු.61,324,161.84ක අගයෙන් 2023.12.31 වනවිට රු.42,512,838.69ක ප්‍රමාණයක් නිදහස් කර ඇත. ඉතිරි කල් ඉකුත්වූ තැන්පතු සම්බන්දයෙන් මු.රෙ. අනුකූලව කටයුතු කිරීමට අදාල නිලධාරීන් දැනුවත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවති.
05	<u>දෙවැනි කොටස : 71.00</u> සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුලත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	2018.01.24 දිනැති අංක 02/2018 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ ඇමුණුම 01 ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු මේ වන විටත් සිදු කරමින් පවතින

		අතර අදාල සියළුම ගිවිසුම් 2024.01.31 දිනට ප්‍රථම අවසන් කිරීමට කටයුතු කරමින් පවතී.
06	ආයතනයේ ගිණුම් පිළිබඳව විගණන මතය වයාවන මට්ටමේ හෝ අභිතකර මට්ටමේ විය.	2021 වර්ෂය සහ 2022 වර්ෂය සඳහා වන විගණකාධිපති වාර්තාව තුලින් ගිණුම් සඳහා සත්‍ය හා සාධාරණ මතයක් ප්‍රකාශ කර ඇත (ඇමුණුම 01 A, B)

පාර්ලිමේන්තු මාලාවේ අංකය: 290
ආයතනයේ නම: ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

අනු අංකය	අඩු පාඩු හා දුර්වලතා	ගනු ලැබූ ක්‍රියාමාර්ග හා වර්තමාන ප්‍රගතිය
01	<u>පළමු කොටස : 97</u> 2004.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් වක්‍රලේඛය ප්‍රකාර රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමු දෙවන සහ තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කර නොතිබුණි.	පෙන්වා දී ඇති පරිදි රජයේ වැටුප් සකස් කිරීමේ පරිගණක මෘදුකාංගයට අදාළ පළමු දෙවන සහ තෙවන මුරපද තුන්මසකට වරක් වෙනස් කිරීමට කටයුතු කර ඇත.
02	<u>දෙවැනි කොටස : 62.00</u> ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබා දීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වාගෙන ගොස් නොතිබුණි. ආයතනයේ පවත්වාගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි.	ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ දැනට ඇති නිල වෙබ් අඩවියේ පවතින තාක්ෂණික ගැටළු හේතුවෙන් නව නිල වෙබ් අඩවියක් නිර්මාණය කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවති.
03	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම් ගතව නොතිබුණි.	දෙපාර්තමේන්තුවේ සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම 2023 වර්ෂය වෙනුවෙන් කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර ඇති බව දන්වන අතර, 2024 වර්ෂය වෙනුවෙන් සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.
04	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය වියාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ විය.	දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව ලබා දී ඇති විගණන මතය වියාවන මට්ටමේ හෝ අහිතකර මට්ටමේ මතයක් නොවන අතර, ලබා දී ඇති මතය වන්නේ " තත්වාගනනය කල මතයක් " වේ. (ඇමුණුම 02)

05	මු.රෙ.119 ප්‍රකාරව අය කළ යුතු අධිභාර අයකර නොතිබුණි.	වයඹ පළාත් ක්‍රීඩා සංකීර්ණය - බිංගිරිය පිහිනුම් තටාකය ඉදිකිරීම ප්‍රමාද වීමට අදාලව අධිභාර ලෙස ප්‍රමාද ගාස්තු වශයෙන් රු.1,440,000.00 ක මුදල මේ වන විට අයකර ගැනීමට කටයුතු කර ඇත.

.....

හරින් ප්‍රනාන්දු (පා.ම)
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍ය

2024.01.11
.....
දිනය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එස්වයිඒ/ඒ/එම්එස්/2/22/01 මගේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 ජූනි 30 දින

ලේකම්
ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන්-වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව යහපත් හා යාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ශීර්ෂය 194 - තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වෙත නිකුත් කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූනි 28 දින නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිත වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය නිරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.
ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. SYA/A/DSD/02/21/02 ඔබේ අංකය உமது இல. Your No.

දිනය திகதி Date 2022 මැයි 31 දින

අධ්‍යක්ෂ ජනරාල්
ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන. ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදය දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.